# ශුද්ධවූ සතියේ
# සඳුදා

## පළමුවන කියැවීම

ඉසයියස් දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ඉසයියස් 42 : 1-7

**ඔහු කතා කරන්නේවත් මොරගසන්නේවත් නැත.**

"මා සහාය දෙන මාගේ සේවකයා මෙන්න, මට ප්‍රිය වූ මාගේ තෝරා ගත් තැනැත්තා මෙන්න. මාගේ ආත්මානුභාවය මා එතුමාට ප්‍රදානය කර ඇත. සියලු ජාතීන්ට එතුමා යුක්තිය ගෙන දෙනු ඇත. එතුමා උස් හඬකින් කතා කරන්නේ වත් මොරගසන්නේ වත් නැත. වීථිවල ඇසෙන පරිදි හඬ නගන්නේ නැත. තැළුණු දණ්ඩක් දමා දමන්නේ නැත. නිවී ගෙන යන පහන් තිරයක් නිවා දමන්නේ නැත.

සැබැවින්ම යුක්තිය ඉටු කරන්නේය. එතුමා කල කිරෙන්නේ වත් අධෛර්යය වන්නේ වත් නැත. මිහිපිට යුක්තිය පිහිටුවන තුරු එතුමාගේ දහම් මඟ උදාවන තුරු දිවැසින් බලා සිටිනු ඇත. "අහස් තලය මවා පිහිටෙවූ ද පොළෝ තලයත් එහි හටගන්න සියල්ලත් නිර්මාණය කළා වූ ද එහි වැසියන් හට පණ නල දුන්නා වූ ද එහි යන එන සතුන්ට ජීවය දුන්නා වූ ද දෙවි සමිඳාණෝ මෙසේ වදාරණ සේක. "යුක්තිය පිහිටුවන පිණිස සමිඳාණන් වන මම නුඹ කැඳවා ගතිමි. මම නුඹ අතින් ගෙන නුඹ හැඩ ගැසීමි.

සෙනඟ හා මා අතර ගිවිසුමක් වන පිණිසත්, සියලු ජාතීන් අතර ආලෝකයක් වන පිණිසත් මම නුඹ පත් කළෙමි. මා එසේ කළේ නුඹ අන්ධයන්ගේ ඇස් පහදන පිණිසත්, සිරගෙයි සිරකරුවන් ද, දඟගෙයි අඳුරෙහි වසන්නන්ද මුදන පිණිසත් ය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 27 : 1-3, 13-14

පිළිතුර: සමිඳාණෝ මාගේ ආලෝකය හා විමුක්තිය ය.

ගීය:

හිමිසඳ මාගේ ආලෝකය හා විමුක්තිය ය. මම කිසිවෙකුට බිය නොවෙමි. හිමිසඳ මාගේ ජීව ශක්තිය ය. මට භීතියක් නැත. දුදනක් වන මාගේ විරුද්ධකාරයෝ සහ සතුරෝ මා කා දමන පිණිස ආ කල ඔව්හු පැකිළී වැටුණෝය.

බල ඇණියක් මට විරුද්ධව කඳවුරු බැන්දත්, මසිතට බියක් නැත. මට විරුද්ධව යුද ගිනි ඇවිළුණත් මම සුරක්ෂිතව සිටිමි.

'ජීවතුන් අතර සමිඳුන්ගේ යහපත්කම මට දක්නට ලැබේ ය'යි මම විශ්වාස කරමි. සමිඳුන් කෙරේ විශ්වාසය තබන්න. ශක්තිමත් වන්න. ධෛර්යයවත් වන්න. සමිඳුන් කෙරේ විශ්වාසය තබන්න.

## සාධුකාරය

අපගේ රජිඳුනි, ඔබ වහන්සේට මංගල වේවා!
ඔබ පමණක් අපේ වරදට අනුකම්පා කළ සේක.

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය. 12 : 1 – 11

***මාගේ භූමදානය සඳහා ඈ එය තබා ගත්තීය.***

ජේසුස් වහන්සේ පාස්කු මංගල්‍යයට සදවසකට පෙර උන් වහන්සේ විසින් මරණයෙන් උත්ථාන කරන ලද ලාසරස් විසූ බෙතානියට වැඩම කළ සේක. ඔව්හු උන් වහන්සේට එහි භෝජන සංග්‍රහයක් පිළියෙල කළහ. මාර්තා උපස්ථාන කළාය. ලාසරස් උන් වහන්සේ සමඟ කෑමට හිඳගත් අයගෙන් කෙනෙකි. එවිට මරියා ඉතා වටිනා සුවඳ විලවුන් ලීටර් භාගයක් රැගෙන උන් වහන්සේගේ පාද ආලේප කොට ඇගේ කෙස් කලඹින් පිස දැමුවා ය. එහි සුවඳින් ගෙය පිරී ගියේය. එවිට උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් එක් කෙනෙක් වූ උන් වහන්සේ පාවා දීමට සිටි ජුදාස් ඉස්කාරියෝත් කතා කොට, මේ විලවුන් රිදී කාසි තුන් සියයකට විකුණා දිළිඳුන්ට නුදුන්නේ මන්දැ"යි ඇසීය. ඔහු මෙසේ කීවේ දිළිඳුන් ගැන කැක්කුමක් තිබුණු නිසා නොව, ඔහු සොරෙකු වූ බැවිනි. පොදු මුදල් පසුම්බිය භාරව සිටි ඔහු එහි දමන ලද දේ සොරා ගන්නට පුරුදුව සිටියේය.

ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "ඈට කරදර නොකරන්න. මා භූමදානය කරන දවස සඳහා ඈ එය තබා ගත්තා වේ. දිළින්දෝ නම් ඔබ සමඟ නිතරම සිටිති. එහෙත් මම ඔබ සමඟ නිතරම නොසිටිමි"යි වදාළ සේක.

ජුදෙව්වරුන්ගෙන් මහා සමූහයක් ජේසුස් වහන්සේ එහි සිටින බව අසා උන් වහන්සේ දැකීමට පමණක් නොව උන් වහන්සේ විසින් මරණයට උත්ථාන කරන ද ලාසරස් දැකීමට ද පැමිණියහ. එබැවින් ලාසරස් ද මරන්නට නායක පූජකයෝ කුමන්ත්‍රණය කළහ. මන්ද, ඔහු නිසා ජුදෙව්වරුන් බොහෝ දෙනෙක් ඔවුන්ගෙන් අහක්ව ගොස් ජේසුස් වහන්සේ අදහා ගත් නිසා ය.

සුවිශේෂ වාක්‍යය එසේ ය.